...of Indigenous Medicine
06 JUN 2019
University of Colombo

කොළඹ විශ්ව විද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය

04 වන බී.ඒ.එම්.එස්. හයවන විශේෂ අතිරේක පරීක්ෂණය - මැයි - ජූනි 2019

## නිදාන චිකිත්සා 11

කාලය - පැය 03

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00

1. දින 03ක සිට පවතින මලබද්ධය, කටින අපහසුතාවය, වාම හස්ත පාද අප්‍රාණිකත්වය, සහ මද ශ්වසන අපහසුතාවය පවසමින් වයස අවුරුදු 48 ක් වයසැති පිරිමි රෝගියෙකු නේවාසික ප්‍රතිකාර සඳහා ආයුර්වේද රෝහලට ඇතුලත් කරන ලදී.

   i. මෙම රෝගියාට ඇති විය හැකි සංකූලතා 3ක් සඳහන් කරන්න. (ලකුණු 03)

   ii. ඉහත රෝගියාට ප්‍රතිකාර කිරීමේදී ඔබගේ අවධානය යොමුවිය යුතු වෛකෘත පරීක්ෂා මොනවාද? (ලකුණු 04)

   iii. ඉහත රෝගියාගේ ශ්වසන අපහසුතාවය පරිපාලනය කරන අයුරු සඳහන් කරන්න. (ලකුණු 03)

   iv. මෙම රෝගියාගේ රෝග විනිශ්චය සඳහන් කර රෝගියා සඳහා සුදුසු චිකිත්සා පත්‍රයක් ලියා දක්වන්න. (ලකුණු 10)

2. පහත සඳහන් කෂායන් ලියා වට්ටෝරු කරන්න.

   i. පර්ණාස පඤ්චකය

   ii. තුනිම්බ දරු දශමූල

   iii. ස්ථිරාදි හය

   iv. පිටවක්කා 9 (ලකුණු 05 × 4)

අනිත් පිටුව බලන්න.

3. i. වර්තමාන සමාජයේ හෘද රෝග වැළඳීමේ ප්‍රවණතාවය වැඩිවීමට හේතු ආයුර්වේද මතානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. හෘද් ශූලයට සුදුසු ප්‍රතිකාර සඳහන් කර හෘද් රෝගයේ උපද්‍රව දක්වන්න. (ලකුණු 08)

iii. අධික රුධිර පීඩනයෙන් පෙළෙන රෝගීන් සඳහා සුදුසු කෂාය 2ක් ලියා වට්ටෝරු කරන්න. (ලකුණු 06)

4. i. "රාජයක්ෂමා" යන වදනෙහි නිරුක්තිය සඳහන් කරන්න. (ලකුණු 02)

II. මුඛයෙන් කැස්ස සමඟ රුධිරය පිටවන අවස්ථා ඇති වියහැකි රෝග සඳහන් කරන්න. (ලකුණු 04)

III. රාජයක්ෂමා චිකිත්සා සූත්‍රය සඳහන් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

IV. රාජයක්ෂමා රෝගියෙකුහට සුදුසු චිකිත්සා පත්‍රයක් (කෂාය වට්ටෝරුකර අනුපාන, චූර්ණ, අවලේහ හා තෛල, එම ඖෂධ මාත්‍රා සහිතව) පිළියෙල කරන්න. (ලකුණු 08)

5. කෙටි සටහන් ලියන්න.

I. ඌරුස්තම්භය

II. ප්‍රතිශ්‍යාය චිකිත්සාව

III. ගත වාත

IV. පොදු ආවරණ වාත චිකිත්සා මූලධර්මය (ලකුණු 05X4)

2019. 06. 06